Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

30814

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade } 6 ශ්‍රේණිය

# සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය / நேரம் / Time } පැය 2 යි

නම / பெயர் / Name } ..........................................................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ..........................................

## I - කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- I කොටසට මේ පත්‍රයේ ම පිළිතුරු සපයා, II කොටස සමඟ අමුණා භාර දෙන්න.

---

- 1, 2 ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත සාම්ප්‍රදායික යෙදුම්වලට අදාළ ව නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) **'තණ්හාව නිසා දිගින් දිගට ම කරදරයට පත් වීම'** යන අරුතට ගැළපෙන ප්‍රස්තාව පිරුළ,

i. ඇටි කෙහෙල් කාපු උගුඩුවා වගේ
ii. අටුව කඩා පුටුව හැදුවා වගේ
iii. වඳින්න ගිය දේවාලෙ හිස මත කඩා වැටුණා වගේ
iv. බළලුන් ලවා කොස් ඇට බාවනවා වගේ

(02) **'අනුනවයෙන් බේරුණා'** යන රූඪියට ගැළපෙන අරුත වනුයේ,

i. සිතා මතා බේරීම
ii. යාන්තමින් බේරීම
iii. අනූනව වාරයක් බේරීම
iv. ආයාසයෙන් තොර ව බේරීම

- හිස්තැනට වඩාත් සුදුසු වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(03) ..................... උදෑසනින් පාසලට ළඟා වීමු.

i. මා   ii. අපි   iii. ඔහු   iv. ඇය

(04) ගොවියෝ කුඹුරු .......................................

i. වපුරයි   ii. වපුරති   iii. වපුරන්නේ ය   iv. වැපිරේ

(05) පියා .................................... රැක ගත්තේ ය.

i. දරුවෝ   ii. දරු පැටව්   iii. දරුවන්   iv. දරුවෙක්

- 6 සිට 8 දක්වා ප්‍රශ්නවල අක්ෂර වින්‍යාසය නිවැරදි වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(06) i. නිදර්ශණ   ii. නිදර්ෂණ   iii. නිදර්ශන   iv. නිධර්ශන

(07) i. ඓෛතිහාසික   ii. ඓතිහාසික   iii. අයිතිහාසික   iv. ඓයිතිහාසික

(08) i. සණ්වාරය   ii. සන්වාරය   iii. සණ්ඨාරය   iv. සන්ථාරය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- ප්‍රශ්න අංක 9 සිට 11 දක්වා ප්‍රශ්නවලට පද තුනක් අර්ථයෙන් සමාන ය. <u>සමානාර්ථයක් නොදෙන පදය</u> තෝරන්න.

(09) i. සඳ ii. සොමි iii. දිනකර iv. තාරපති

(10) i. අහස ii. ගගන iii. ගුවන iv. මහී

(11) i. වනිතාව ii. ගැහැනිය iii. වෙළඹ iv. කත

- ප්‍රශ්න අංක 12 සිට 15 දක්වා ප්‍රශ්නවලට අක්ෂර මාලාව ඇසුරින් නිවැරදි පිළිතුර තෝරන්න.

(12) නූතන සිංහල අක්ෂර මාලාවේ ස්වර ගණන කීය ද?
i. 20කි. ii. 18කි. iii. 10කි. iv.12කි.

(13) සෑම පදයක ම මහාප්‍රාණ අක්ෂර යෙදී ඇති පිළිතුර තෝරන්න .
i. ආර්ථික, ලේඛන ii. සෞඛ්‍ය, අභල
iii. ඇතා, ඇස iv. අහස, පඨවි

(14) 'සාර පලය අඹ දඹ රඹ ද වල්පිට' යන පද්‍ය පදයේ යෙදී ඇති සඤ්ඤක අකුරු ගණන වන්නේ,
i. 3කි. ii. 5කි. iii. 2කි. iv. 4කි.

(15) <u>කැ</u>කිරි, <u>කු</u>රුලු යන වචනවල ඉරි ඇඳි අකුරේ පිල්ලම් පිළිවෙළින් දැක්වෙන්නේ,
i. පාපිල්ල, පා පිල්ල ii. ඇලපිල්ල, පාපිල්ල
iii. කෙටි ඇදපිල්ල, කෙටි පාපිල්ල iv. ඇලපිල්ල, කෙටි පාපිල්ල

(16) "බටහිර අහස රත් පැහැ කරමින් සූර්යයා ගිනිබෝලයක් මෙන් බැස යයි" යන වාක්‍යයේ උපමා උපමේය වෙන් කර දක්වන්න.

උපමාව : ..................................................................................................................

උපමේය: ..................................................................................................................

(17) '<u>රන්</u> කරඬුව රැගත් ඇතා <u>ශාන්ත</u> ගමනින් පෙරහැරේ ගමන් කරයි' යන වාක්‍යයේ ඉරි ඇඳි පද පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

i. නාම විශේෂණ, නාම විශේෂණ
ii. නාම විශේෂණ, ක්‍රියා විශේෂණ
iii. ක්‍රියා විශේෂණ, ක්‍රියා විශේෂණ
iv. ක්‍රියා විශේෂණ, නාම විශේෂණ

(18) **'විශේෂ'** යන වචනයේ විරුද්ධාර්ථ පදය වන්නේ ,
i. අතිවිශේෂ ii. සුවිශේෂ iii. සාමාන්‍ය iv. අසාමාන්‍ය

(19) **'පුංචි පැළේ ගස වෙනා'** යන ස්වයං ලිඛිත චරිතාපදානය කාගේ ද?
i. මාර්ටින් වික්‍රමසිංහ ii. කුමාරතුංග මුනිදාස
iii. ඩී.පී වික්‍රමසිංහ iv. කේ. ජයතිලක

(20) **'උදේනි පුර සැණකෙළිය'** ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?
i.ගුත්තිල කාව්‍යය ii. ගුත්තිල ජාතකය iii. සංදේශ කාව්‍යය iv. කාව්‍යශේඛරය

(ලකුණු 2x20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(1) පන්ති කාමරයේ දී කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ශ්‍රී ලංකා මාතාව වෙනුවෙන් ලියැවුණු පොත් පිංචක් සෑදීමට ඔබට පැවරුණේ යැයි සිතා, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i. ඔබ නිර්මාණය කරන ලද පොත් පිංච සඳහා යෙදූ නම ලියන්න.
ii. කණ්ඩායම් ක්‍රියාකාරකම සඳහා සහාය දැක්වූවෝ කවරහු ද?
iii. කණ්ඩායම් ක්‍රියාකාරකම තුළ ඔබ මුහුණ දුන් අභියෝග දෙකක් ලියන්න.
iv. එම අභියෝග ජයගැනීමට ඔබ යෙදූ උපක්‍රම දෙකක් ලියන්න.
v. කණ්ඩායම් ක්‍රියාකාරකමක නිරත වීම මගින් ඔබ අත්කර ගත් වාසියක් ලියන්න. (ලකුණු 2x5 = 10)

(2) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150කට නො අඩු වන සේ රචනාවක් ලියන්න.
i. මේ සුන්දර අපගේ රටයි
ii. තුරුලතා අපේ මිතුරෝ ය
iii. සොඳුරු ළමාවිය
iv. නීරෝගී බව සඳහා ආහාර
v. මම ගැල්කරුවෙක්මි (ලකුණු 20)

(3) පාසලේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් ව නගරයේ පාසලකට ගිය ඔබගේ හොඳ ම මිතුරාට/ මිතුරියට මෙවර ඔබ පාසලේ ත්‍යාග ප්‍රදානෝත්සවයේ තෑගි ඇති බවත්, ඒ සඳහා සහභාගී වන ලෙසත් දන්වමින් පෞද්ගලික ලිපියක් ලියන්න. (ලකුණු 10)

(4) පෙළ පොත ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
i. ''අලි උවදුර'' පාඩම උපුටා ගත් කෘතිය කුමක් ද?

ii. ''අපොයි හරි වැස්ස
වෙලත් උතුරන්න''
මෙය ඇතුළත් නාට්‍යයේ නම කුමක් ද?

iii. '' අපට කුකුරුමුවන් ගෙඩි ටිකක් කඩාගන්ට ඇත්නම්''
මෙය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

iv. ''එක කාරණේකට නෙවෙයි, දහ කාරණේකට වුණත් මම එකඟ වෙන්නම්''
මෙය කවුරුන් විසින් කා හට කියන ලද්දේ ද?

v. ''නුඹ වහන්සේ එන තෙක් බලා උනුම්හ'
මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න. (ලකුණු 2x5 =10)

(5) ඡේදය ඇසුරින් පිළිතුරු ලියන්න.

දුටුගැමුණු රජතුමාගේ දස මහා යෝධයන්ට අමතර ව යුද්ධ හමුදාවට එක් වූ යෝධයකු පිළිබඳ ජන කථාවල සඳහන් වේ. දුටුගැමුණු රජතුමා මහියංගණ චෛත්‍යය ප්‍රතිසංස්කරණය කිරීමට පටන් ගත්තේ ය. දාගැබ බඳවමින් සිටිය දී රජතුමාට බුලත් මෙහෙ වැඩීමට උඩුදුම්බර ප්‍රදේශයේ කිරි පට්ටිය නම් ගමෙහි උපන් ශක්ති සම්පන්න පුරුෂයකු පත් කර ගන්නා ලදී. රජවාසල හැමෝ ම ඔහුට 'බුලතා' යි කීහ. ඔහුගේ රාජකාරිය වූයේ දවසකට හත් වරක් බුලත්විට සාදා රජතුමාට පිළිගැන්වීම යි.

i. මෙහි සඳහන් රජතුමා කවුද?
ii. ඡේදයට අනුව ඔහු විසින් ප්‍රතිසංස්කරණය කරන ලද චෛත්‍යය කුමක් ද?
iii. බුලතාගේ රාජකාරිය කුමක් ද?
iv. මෙහි සඳහන් වන ප්‍රදේශය නම් කරන්න.
v. "චෛත්‍යය" යන්නට සමානාර්ථ පදයක් ඡේදයෙන් උපුටා ලියන්න.

(ලකුණු 2x5 = 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**තෙවන වාර පරීක්ෂණය - 2023**

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

**6 ශ්‍රේණිය**

**පිළිතුරු පත්‍රය**

**I කොටස**

1. i
2. ii
3. ii
4. ii
5. iii
6. iii
7. ii
8. i
9. iii
10. iv
11. iii
12. ii
13. i
14. i
15. iii

16. උපමාව :- ගිනිබෝලයක් මෙන්
උපමේය :- බැසයන හිරු

17. ii 18. iii 19. iv 20. i
(ලකුණු 2 × 20 = 40)

**II කොටස**

**01)** සුදුසු පිළිතුරු මත ලකුණු ලබා දෙන්න.
(ලකුණු 2 × 5 = 10)

**02)** තෝරාගත් මාතෘකාවට අදාළ ව සාරවත් කරුණු මත නිර්මාණශීලි රචනාවක් ලිවිය යුතු ය. අක්ෂර වින්‍යාසය , උක්ත ආඛ්‍යාත රටා පිළිබඳව ද සැලකිලිමත් වන්න.
(ලකුණු 20)

**03)** පෞද්ගලික ලිපියක ආකෘතිය ගැන සැලකිලිමත් විය යුතු ය. දී ඇති කරුණු මත ලිපියේ අභ්‍යන්තර සකස් කර තිබිය යුතුය.
(ලකුණු 10)

**04)**
i. කියවන නුවණ
ii. නරිබෑණා නාට්‍යය
iii. විවෙං වුලහෙං යමු කිරි නැනෝ
iv. ඉබ්බා විසින් කොක්කු දෙන්නාට
v. නලපාන ජාතකය
(ලකුණු 2 × 5 = 10)

**05)**
i. දුටුගැමුණු රජතුමා
ii. මහියංගණ චෛත්‍ය
iii. රජතුමාට බුලත් මෙහෙවැඩීම
iv. උඩුදුම්බර , මහියංගණය
v. දාගැබ
(ලකුණු 2 × 5 = 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**තෙවන වාර පරීක්ෂණය - 2023**

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

**6 ශ්‍රේණිය**

**පිළිතුරු පත්‍රය**

**I කොටස**

1. i
2. ii
3. ii
4. ii
5. iii
6. iii
7. ii
8. i
9. iii
10. iv
11. iii
12. ii
13. i
14. i
15. iii

16. උපමාව :- ගිනිබෝලයක් මෙන්
 උපමේය :- බැසයන හිරු

17. ii 18. iii 19. iv 20. i
(ලකුණු 2 × 20 = 40)

**II කොටස**

**01)** සුදුසු පිළිතුරු මත ලකුණු ලබා දෙන්න.
(ලකුණු 2 × 5 = 10)

**02)** තෝරාගත් මාතෘකාවට අදාළ ව සාරවත් කරුණු මත නිර්මාණශීලි රචනාවක් ලිවිය යුතු ය. අක්ෂර වින්‍යාසය , උක්ත ආඛ්‍යාත රටා පිළිබඳව ද සැලකිලිමත් වන්න.
(ලකුණු 20)

**03)** පෞද්ගලික ලිපියක ආකෘතිය ගැන සැලකිලිමත් විය යුතු ය. දී ඇති කරුණු මත ලිපියේ අභ්‍යන්තර සකස් කර තිබිය යුතුය.
(ලකුණු 10)

**04)**
i. කියවන නුවණ
ii. නරිබෑණා නාට්‍යය
iii. විවෙං චුලහෙං යමු කිරි නැනෝ
iv. ඉබ්බා විසින් කොක්කු දෙන්නාට
v. නලපාන ජාතකය
(ලකුණු 2 × 5 = 10)

**05)**
i. දුටුගැමුණු රජතුමා
ii. මහියංගණ චෛත්‍ය
iii. රජතුමාට බුලත් මෙහෙවැඩීම
iv. උඩුදුම්බර , මහියංගණය
v. දාගැබ
(ලකුණු 2 × 5 = 10)

ඉස්කෝලෙට ඉස්කෝලෙන් උදව්වක්...
Iskolee.com
ප්‍රශ්න පත්‍ර ඇතුලු බොහෝ දේ PDF ආකාරයෙන් නොමිලේ ලබා ගන්න..